# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2154/2 – 2019 දෙසැම්බර් 16 වැනි සඳුදා – 2019.12.16

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගයන්ත කරුණාතිලක වන මම මෙයින් ප්‍රකාශ කරමි.

උතුරු මැද පළාතේ, පොලොන්නරුව දිස්ත්‍රික්කයේ, ඇලහැර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, සිංහල පත්තුව සුළු කොට්ඨාසයේ, අංක 01 කිරිඔය ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, අතරගල්ලෑව ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක PO/ELH/2015/065 හා 2016.05.17 දිනැති ප්‍රගමන අනුරේඛනයේ පහත සඳහන් ඉඩම් කොටසට මායිම්:

01. **කැබලි අක්ෂර 'A' – අතරගල්ලෑවකැලේ – ප්‍රමාණය: හෙක්. 2.429**
උතුරට සහ නැගෙනහිරට: අ.භූ.පි. 25 හි කැබලි අංක 901; දකුණට: අ.භූ.පි. 25 හි කැබලි අංක 901 සහ 899; බටහිරට: අ.භූ.පි. 25 හි කැබලි අංක 899 සහ 901.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය: 4-3/2/2014/WR/278.
2019 සැප්තැම්බර් මස 21 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
"මිහිකත මැදුර", 1200/6,
රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

01 – 05